www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

# Buddhist

# බුද්ධ ධර්මය

Name :- .................................................... Grade : -................ Index number:-....................

➢ **ප්‍රශ්න අංක 1 - 10 දක්වා ගැළපෙන පිළිතුර සොයා යටින් ඉරක් අඳින්න.**

1. සත් සතිය ගත කරණ ලද බුදුරජාණන් වහන්සේ දෙවන සතියේ දී ලොවට දුන් ආදර්ශය වූයේ,

(1) දෙමව්පියන්ට සැලකීම. (2) වැඩිහිටියන්ට සැලකීම.
(3) කලගුණ සැලකීම. (4) ගුරුවරුන්ට සැලකීම.

2. බුදු රජාණන් වහන්සේ රුවන් සක්මනයෙහි යෙදුණේ,

(1) දෙවන සතියේ ය. (2) තෙවන සතියේ ය.
(3) සිව්වන සතියේ ය. (4) පස්වන සතියේ ය.

3. බුදු රජාණන් වහන්සේට අත්සුණු හා මී පිඬු පූජා කළේ,

(1) භද්ද වග්ගිය කුමාරවරුය. (2) සිගාල ගෘහපතිය.
(3) අනේ පිඬු සිටුතුමා ය. (4) තපස්සු භල්ලුක දෙදෙනාය.

4. ප්‍රථම ධර්ම දේශනාව වන්නේ,

(1) ධම්සක් පැවතුම් සූත්‍රය (2) මංගල සූත්‍රය
(3) රතන සූත්‍රය (4) කරණීයමෙත්ත සූත්‍රය

5. පස්වග තවුසෝ රහත් වූයේ කුමන සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් ද?

(1) ධම්සක් පැවතුම් සූත්‍රය. (2) අනත්ත ලක්ඛන සූත්‍රය.
(3) මහා මංගල සූත්‍රය. (4) මේ කිසිවක් නොවේ.

6. බුදුරජාණන් වහන්සේ ජීවමානව දැකීමට නොහැකිය. නමුත් අප විසින් කළ යුත්තේ,

(1) දන්සැල් දීම හා තොරන් ප්‍රදර්ශනය කිරීමය.
(2) බුදු පිළිම සෑදීමට ආධාර කිරීම.
(3) බුදු රජාණන් වහන්සේගේ ධර්මය දැක ශ්‍රද්ධාවන්ත වීමයි.
(4) වෙනත් ආගම අදහන අයට එරෙහි වීම.

7. 'විරිත්' යනු....

(1) කළ යුතු හොඳ දේවල් ය. (2) නොකළ යුතු හොඳ දේවල් ය.
(3) කළ යුතු නරක දේවල් ය. (4) නොකළ යුතු නරක දේවල් ය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. සිගාලෝවාද සූත්‍රය අනුව ගුරුවරයාට නමස්කාරය කරන දිශාව වන්නේ,
   (1) නැගෙනහිර දිශාවය. (2) උතුරු දිශාවය.
   (3) දකුණු දිශාවය. (4) බටහිර දිශාවය.

9. ඔබේ ශාස්තෘවරයා කවරෙක්ද? ඔබ රුචිකරණ ධර්මය කුමක්ද? මෙසේ බුදුරජාණන් වහන්සේගෙන් විමසන ලද්දේ,
   (1) තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් (2) උපතිස්ස පිරිවැජියා ය.
   (3) යසකුල පුත්‍රයා ය. (4) උපක ආජීවකයා ය.

10. 'රජතුමනි', මට පැවිදි වීමට අවසර දෙන්නේ නම්, මම ඒ දේ ඉටු කරමි'' පැවසුවේ කවුරුන් ද?
   (1) සංජය පිරිවැජියා ය. (2) උපතිස්ස පිරිවැජියා ය.
   (3) යසකුල පුත්‍රයා ය. (4) කළුදායි ඇමතිවරයා ය.

- අංක 11-15 දක්වා (A) කොටසේ කරුණු (B) කොටසේ කරුණු සමඟ ගළපා යා කරන්න.

| | (A) කොටස | | (B) කොටස |
|---|---|---|---|
| 11. | ධර්මය ගුරු තන්හි තබා ගැනීම තීරණය කළේ | a) | තිරොකුඩ්ඩ සූත්‍රය |
| 12. | රජතුමාගේ පින් බලාපොරොත්තු වූ ඥාති ප්‍රේත ආදීන්ට පින් අනුමෝදන් කළ යුතු සූත්‍ර දේශනාව | b) | පස්වන සතිය |
| 13. | සදිසා නමස්කාරය | c) | බුද්ධ |
| 14. | ප්‍රතිවේද ඥානයෙන් යුක්ත වීම | d) | සිගාලෝවාද සූත්‍රය |
| 15. | සියළු කෙලෙසුන් බිඳ දමා නිවනට ගමන් කළ හෙයින් | e) | සුගත |

- ප්‍රශ්න අංක 16-20 දක්වා හරි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද යොදන්න.

16. බුදු රජාණන් වහන්සේ දමනය කළ නොහැකි සියල්ල දමනය කිරීමේ හැකියාව අනුත්තර පුරුසධම්මසාරථී ගුණය නම් වේ. (  )
17. පූතිගත්තතිස්ස හිමි යනු බුදු වහන්සේගේ මහා කරුණාවට ලක්ව පිහිට ලද තෙර නමකි. (  )
18. වේළුවනාරාම පූජාව බුදු සසුනේ දෙවන ආරාම පූජාවයි. (  )
19. ධම්ම පදය බෞද්ධයාගේ අත්පොතයි. (  )
20. අග්‍ර ශෂ්‍ය දානය යනු අස්වනුවල පළමු කොටස තෙරුවනට පූජා කිරීමයි. (  )

(ලකුණු 20 × 2 =40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. (1) ගිහියාගේ නිත්‍ය ශීලය කුමක් ද?
(2) ආජීව අෂ්ඨක ශීලයේ සිල් පද සංඛ්‍යාව කීයද?
(3) විශාඛා සිටු දියණියගේ පියා කවුද?
(4) විශාඛා සිටු දියණියට ලැබුණු උපදෙස්වල ඇති 'පිටත ගිනි ඇතුළට නොගත යුතුය' යන්නෙහි අර්ථය ලියන්න.
(5) කාව්‍යශේඛරය රචනා කළේ කවුද?
(6) 'යහපත් කොට යෙතැයි - සුන්දර තැනට සැපතැයි' යන කවිය සම්පූර්ණ කරන්න.
(7) සතර පෙර නිමිති නම් කරන්න.
(8) වේළුවනාරාමය පූජා කළේ කවුද?
(9) පංචශීලයෙහි අඩංගු හතරවන ශික්ෂා පදය ලියන්න.
(10) අඥාවන්ත වෙළඳ නායකයා හා ඥාණවන්ත වෙළඳ නායකයා පිළිබඳ සඳහන් ජාතක කථාව ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (1) ''ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා'' යන කවිය සම්පූර්ණ කරන්න.
(ලකුණු 2)
(2) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ගුරුවරුන්ගෙන් ලැබෙන උපකාර 03ක් ලියන්න.
(ලකුණු 3)
(3) ගුරු සිත නොරිදවා කටයුතු කිරීමෙන් ඔබේ ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය උදාහරණ දෙකක් ආශ්‍රිතව විස්තර කරන්න.
(ලකුණු 5)

03. (1) 'මිච්ඡා ආජීව' යනු කුමක්ද?
(ලකුණු 2)
(2) පංච ශීලයේ අඩංගු මුල් ශික්ෂා පද 03 ලියන්න.
(ලකුණු 3)
(3) පන්සිල් රැකීමෙන් යහපත් සමාජයක් ගොඩ නගා ගත හැකි ආකාරය උදාහරණ 3ක් ආශ්‍රය කරගෙන විස්තර කරන්න.
(ලකුණු 5)

04. (1) බුදුරජාණන් වහන්සේ 'අක්කොච්ජි මං අවධි මං'' යන ගාථා දේශනා කොට වදාළේ කවුරුන් සඳහා ද?
(ලකුණු 2)
(2) අක්කොච්ජි මං යන ගාථාවේ නැවත නැවත වෛරීය සිතුවිලි ඇති කර නොගන්නා ගේ වෛරය නැති වේ'' යන ගාථාව සම්පූර්ණ කරන්න.
(ලකුණු 3)
(3) ඉහත ඔබ සඳහන් කළ ගාථාව ශිෂ්‍ය ජීවිතයට වැදගත් වන ආකාරය උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 5)





agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk


සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

05. (1) බුදුරජාණන් වහන්සේගේ අග්‍ර දායකයාගේ නම කුමක්ද?
(ලකුණු 2)

(2) අග්‍ර දායකයාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 3ක් ලියන්න.
(ලකුණු 3)

(3) එම ලක්ෂණ චරිතායනය කිරීමෙන් ගත හැකි ආදර්ශ උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.
(ලකුණු 5)

06. (1) A හා B රූපවල සඳහන් ඉරියව් නම් කරන්න.



A



B

(ලකුණු 2)

(2) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ලක්ෂණ 3ක් ලියන්න.
(ලකුණු 3)

(3) මෛත්‍රී ගුණය සමාජය තුළ වර්ධනය වීමෙන් ලැබෙන ප්‍රතිඵල 5ක් ලියන්න.
(ලකුණු 5)

07. (1) සිරිත් විරිත් ගැන කියා දෙන්නට තිබෙන හොඳම පොත කුමක්ද?
(ලකුණු 2)

(2) 'ඇඳුමට වැඩිය වියදම් නොකරන්නේ' යන කවිය සම්පූර්ණ කරන්න.
(ලකුණු 3)

(3) එම කවියෙන් අපේ ජීවිතයට ගත හැකි ආදර්ශ 5ක් ලියන්න.
(ලකුණු 5)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk